# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
# ජනරජයේ ගැසට් පත්‍රය

## 2010 ජුනි මස 18 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2010. 06. 21 දින නිකුත් කරන ලදී)**

**මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය**
**(කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ)**

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව)**
**සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ)

## මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව.**

මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) යනුවෙන් හඳුන්වනු ලබන සංගමයක් සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 2010 අංක       දරන මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) සංස්ථාගත කිරීම.**

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) තත්කාලීන සාමාජිකයන් හා මින් මතු මෙයින් සංස්ථාපනය කරනු ලබන සංගමයට සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව)" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාපිත නමින් සංථාව විසින් ද සංස්ථාවට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මාතර රාහුල විද්‍යාලයීය අධ්‍යාපනය ලැබූ ආදි ශිෂ්‍යයන් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් සේවයේ යෙදුනු ගුරුවරුන්, වර්තමාන ආචාර්ය මණ්ඩලයේ ගුරුවරුන් යන අයගේ අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජීය කටයුතු ප්‍රවර්ධනය කිරීම;

(ආ) මාතර රාහුල විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ සහ රුහුණේ ජනතාවගේ අභිවෘද්ධිය සඳහා අවශ්‍ය භෞතික සම්පත් සහ වෙනත් යටිතල පහසුකම් සැලසුම් කිරීම සැපයීම, සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම ;

(ඇ) ආදි ශිෂ්‍යයන් හා ගුරුවරුන් අතර සුහදතාවය වර්ධනය කෙරෙන පරිදි සුභසාධන, සංස්කෘතික හා සාමාජ සංවර්ධන සේවා ප්‍රවර්ධනය කිරීම;

(ඈ) රාහුල ශිෂ්‍යත්ව භාරය පිහිටුවා ශිෂ්‍යත්ව, අධි ශිෂ්‍යත්ව, ත්‍යාග සහ වෙනත් ප්‍රදානයන් කිරීම;

(ඉ) පුස්තකාල, පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ඊ) ශිෂ්‍යයන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා දේශීය හෝ විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(උ) සංස්ථාවේ කටයුතු සඳහා ආදායම් උපදවන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම;

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංගමයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංගමයේ මුදල් ආයෝජනය කිරීමේ ද සංගමයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය

ඇතුළුව සංගමයේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ සියලු ක්‍රියා කරුණු හෝ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ විධිවිධානවලට සහ සංගමයේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයන්ගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින් මේ පනතේ රීතිවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුත්තේ ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

(2) සංගමයේ ප්‍රථම විධායක කාරක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ විධායක කාරක සභාවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

6. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, බූදල් පිළිබඳ නීයාදනයකින් හෝ අන් ලෙසකින් සංගමය සතු වන කවර වුවද චංචල හෝ නිශ්චල දේපළක් මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව භාර ගැනීමට හා දැරීමට සංගමයට නීතියෙන් හැකියාව හා ශක්‍යතාවය තිබිය යුතු අතර, එබඳු සියලු දේපළ තත්කාලයේ සංගමයේ බලාන්විතව පවතින රීතිවලට යටත්ව ඒවා විකිණීමේ උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ලෙසකින් බැහැර කිරීමේ පූර්ණ බලතල සහිතව, මේ පනතේ කාර්යයන් සඳහා සංගමය විසින් ඒවා දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් වර්ගයට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු , ඔවුන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) විධායක කාරක සභාවේ සාමාජිකයන් හා ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, විධායක කාරක සභාවේ සාමාජිකයන් සාමාජිකත්වයෙන් හෝ ධුරයෙන් ඉල්ලා

අස්වීම හෝ සාමාජිකත්වය හෝ ධුරය අත් හැරීම හෝ සාමාජිකත්වයෙන් හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ විධායක කාරක සභාවේ සාමාජිකයන්ගේ බලතල, කාර්යය, චර්යාව සහ සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් සේවයට පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය කර්තව්‍ය සහ චර්යාව ;

(ඈ) විධායක කාරක සභාවේ සහ සංස්ථාවේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම් සහ පැවැත්වීම, පුරප්පාඩු පිරවීම, එම රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ ඒවායේ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කාරණා ;

(ඇ) විධායක කාරක සභාවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම සඳහා ;

(2) (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයටම සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකිය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, තෙස්තමේන්තු නීයාදන, පැවරීම්, පරිත්‍යාග, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් සංස්ථාව විසින් භාර ගනු ලබන සියලුම මුදල් විධායක කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය මුදල් මෙකී අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් මෙහි දක්වා ඇති පරිදි සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපළවලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම පැවරීම කරනු නොලැබිය යුතු ය. අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපළවලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

**9.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**සංස්ථාවේ මුද්‍රාව.**

10. සභාපතිවරයා ද ලේකම් හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයෙකු ද ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාරහිරව විය යුතු ය.

**ආයතනය විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.**

11. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති ආයතනයේ සියලුම ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතු සියලු ණය හා ආයතනය වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.**

12. සංස්ථාවේ කිසිදු සාමාජිකයකු පදනම් භාරයේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඒ සාමාජිකයාගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

13. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේය.

**සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා වගකීමෙන් නිදහස් කිරීම.**

14. මේ පනතින් හෝ ඒ යටතේ හෝ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

15. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.